**බිංගිරිය ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිම කර තිබුණු එකතු වටිනාකම රු.3,158,358 ක් වූ ගොඩනැගිලි 03 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශ මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය තුළ ප්‍රයෝජනයට ගනු ලබන අත් කරත්ත 04 වටිනාකම රු.106,000 ක් නිර්දේශයකින් තොරව මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඉවත්කර තිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.362,140 ක් වූ ඖෂධවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | -එම - | -එම - |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට අවසන් වී නොමැති නඩු 03 ක් පැවති අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | -එම - | අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉඩම් ගොඩනැගිලි, සේවක ඇප, මෝටර් රථ සහ කරත්ත යන ගිණුම් විෂයන්වල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල පැවති ශේෂයන් අතර රු.13,635,962 ක වෙනසක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් සහ ඊට අදාළ උපලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | සභාව විසින් 2018 ට පෙර ලබා දුන් රු.358,252 ක් වූ අත්තිකාරම් 16 ක් හා රු.822,418 ක් වූ හඳුනා නොගත් අත්තිකාරම් ශේෂයක් පියවා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571 (2) | ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් , රු.292,912 ක් වටිනා ඉකුත් තැන්පතු ආපසු ගෙවීම හෝ රාජ්‍ය ආදායමට ගැනීම මඟින් නිරවුල් කර නොතිබුණි. | -එම - | -එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2022 පෙබරවාරි 25 දිනැති අංක 1/2022 දරන 1/2002 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි | සභාව සතු වාහන 3 ක් සඳහා 2023 වර්ෂය සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | -එම - | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන චක්‍රලේඛ | | | |
| (i) | 2015 නොවැම්බර් 02 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු අංක චක්‍රලේඛ අංක 03/2015 | වීදි පහන් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | -එම - | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2018/07/19 දිනැති අංක 2018/e – local government 01 චක්‍රලේඛය | අන්තර්ජාල හරහා අයදුම්පත ඉදිරිපත් කිරීමට හා ගෙවීම් කිරීමට පුරවැසියන්හට පහසුකම් සලසා නොතිබුණි. | -එම - | -එම - |
| (iii) | 2010 ජූලි 30 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු අංක 2010/02 චක්‍රලේඛයේ 1.2. ii. වගන්තිය | විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එපරිදි සිදුකර නොතිබුණි. | -එම - | -එම - |
| (ඈ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහි දී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර එය සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 218 රීතිය | පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | -එම - | -එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.40,744,083 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.77,412,377 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා බැංකු ජංගම ගිණුමේ 2023 වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂ කිහිපයක සිට පැවත එන හඳුනා නොගත් රු.181,846 ක හර ශේෂය හඳුනා ගැනීමට සහ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවක ඇප තැන්පත් වල වටිනාකම රු.243,499ක් වුවත් , ඉන් ආයෝජනය කර තිබුනේ රු.167,674 ක් වූයෙන් රු.75,825 ක වෙනසක් පැවතුණි. | -එම - | -එම - |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | 2022 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,960 | 17,613 | 5,189 | 87 | 4,692 | 1,707 | 3,209 | 179 |
| කුලී | 20,902 | 6,799 | 17,715 | 20 | 20,872 | 6,629 | 14,525 | 118 |
| බලපත්‍ර ගාස්තු | 2,466 | - | 2,219 | - | 1,802 | - | 1,564 | - |
| වෙනත් ආදායම් | 67,483 | - | 64,266 | - | 115,603 | - | 84,637 | - |
| එකතුව | 96,811 | 24,412 | 89,389 | 107 | 142,969 | 8,336 | 103,937 | 297 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.43,420 ක හිඟ වරිපනම් සහ රු.37,591 ක අක්කර බදු අයවිය යුතුව පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ වරිපනම් ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | 2012 වර්ෂයේ සිට මස් කඩ 5 කින් අයනොවී පවතින රු.381,650 ක හිඟ බදු කුලියක් පැවතුණි. | -එම - | හිඟ ශේෂ කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | වීරපොකුණ සතිපොළේ ඌරු මස් කඩය සඳහා 2012 සහ 2013 වර්ෂ සඳහා පිළිවෙලින් අයවිය යුතු රු.241,038 ක් සහ රු. 38,100ක හිඟ මුදල් සඳහා නීතිමය කටයුතු සිදුකර නඩු තීන්දුව ලැබී තිබුන ද මුදල් අයකර ගෙන නොතිබුණි. | -එම - | -එම - |
| (ඈ) | 2023 වර්ෂයට අදාළව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.8,489,208 ක් හා මුද්දර ගාස්තු රු.12,468,525 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවතුණි. | -එම - | හිඟ ශේෂ කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.2,369,562ක් වැය දරා තිබුණ ද රු.350,335 ක ආදායමක් පමණක් උපයා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදන කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 09 ක වටිනාකම වූ රු.43,411,464 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සභාව වෙත අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ගෙවිය යුතු ගිණුම් 05ක එකතු වටිනාකම රු.87,309,439 ක් විය. | -එම - | -එම - |
| (ඇ) | ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ප්‍රජා මණ්ඩල 15 කට 2020 වර්ෂයේ දී පුටු 725 ක්, සමර්හට් 14 ක් සහ ප්ලැෂ් ලයිට් 28 ක් සභාව විසින් ලබා දී තිබුණ ද , එම භාණ්ඩ ප්‍රජා මණ්ඩල විසින් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගන්නේ ද යන්න පිළිබඳව පසුවිපරමක් සිදුකර නොතිබුණි. | -එම - | -එම - |
| (ඉ) | වසර ගණනාවක සිට පැවත එන රු.249,853ක හඳුනා නොගත් සේවක ණය ශේෂ පැවති අතර එය හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සේවක ණය නිසි පරිදි අයකර ගත යුතුය |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු හා සවි කිරීම් , යන්ත්‍ර හා උපකරණ යන මෝටර් රථ වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු ය. |
| (ආ) | වීදි පහන් ලේඛනය සහ දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි. | -එම - | වීදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු ය. |
| (ඇ) | සභාවට අයිති ක්‍රීඩාපිටි 18ක් හදුනාගෙන තිබුණද විගණිත දිනය වන විටත් ඒවායේ අයිතිය තහවුරු කර නේතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු බව |
| (ඇ) | සභාව විසින් නඩත්තු කැන සුසාන භූමි සංඛයාව 122ක් වු අතර ඉන් සුසාන භූමි 40ක ඉඩම් අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | එම | එම |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 01 ක් හා අතිරික්ත 03 ක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර ගත යුතු වේ. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2014 යටතේ බඳවා ගෙන ඇති නමුත් විගණිත දිනය වන විට අදාළ නතතුරු සඳහා අනුමැතිය හිමි වී නොතිබූ සේවකයින් 5 ක් විය. | -එම - | -එම - |

### 3.5 වාහන පද්ධති කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෝටර් රථ වාහන 18 ක් 2023/නොවැම්බර් 08 දින ප්‍රත්‍යාගණනය කර තිබුණ ද , ප්‍රත්‍යාගණිත වටිනාකම් මඟින් වත්කම් ලේඛනය යාවත්කාලීන නොකර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු ය. |
| (ආ) | පිරිවැය වටිනාකමකට රු.245,000 ක් වත්කම් ලේඛනවල ඇතුළත් කර තිබූ අංක රහිත ජල බවුසරය 2023 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | -එම - | -එම - |
| (ඇ) | මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව සභාව විසින් වාහන ලේඛනයේ සභාව සතු ට්‍රේලර් පිළිබඳ තොරතුරු එහි ඇතුළත් කර නොතිබුණි. | -එම - | -එම - |
| (ඈ) | සභාව සතුව පැවති කාර් රථයක් හා 32 – 0963 අංක දරන රථය අයිතිය විගණිත දින වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | -එම - | -එම - |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 59 ක සිට සියයට 134 ක් දක්වා විචලන පැවතුණු අතර වියදම් විෂයයන් 77 ක ඇස්තමේන්තුගත හා සත්‍ය වියදම අතර සියයට 75 කට වඩා වැඩි විචලන පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කිකව පිළියෙල කළ යුතුය. |

**4.2 තිරසර සංවර්ධන ඉලක්ක**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 අරමුණු ළඟා කර ගැනීමට සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කළ ව්‍යාපෘති 27 ක් අතුරින් ව්‍යාපෘති 13 ක් ඉටුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ඒවා ළඟා කරගත යුතු ය. |
| (ආ) | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා වර්ෂය තුළ ඉටුකළ ව්‍යාපෘති 14 සඳහා රු.7,400,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද , සත්‍ය වැය දැරීම රු.2,757,220 ක් වූයෙන් අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි. | -එම - | -එම - |